# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2314/16 - 2023 ජනවාරි මස 11 වැනි බදාදා - 2023.01.11**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2003 අංක 25 දරන මුදල් පනත**

2(1) වැනි වගන්තිය යටතේ නියමය

2003 අංක 25 දරන මුදල් පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව, මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, මෙම නියමය මගින් 2023 ජනවාරි 12 දින සිට ක්‍රියාත්මක වන පරිදි, මෙහි පහත උපලේඛනය 1 හි 1 තීරුවේ නිශ්චිතව දක්වා ඇති තැනැත්තන්ගෙන් එම උපලේඛනයේ II වන තීරුවේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ අනුව, අපගමන බද්දක් පනවා අය කර ගනු ලැබිය යුතු බව හා උපලේඛනයේ II හි සඳහන් නියෝග මෙම බද්ද අයකිරීම සඳහා අදාළ වන බව ප්‍රකාශයට පත් කරමි.

2003 අංක 25 දරන මුදල් පනත යටතේ සකස්කර 2012 දෙසැම්බර් 31 දිනැති අංක 1791/8, 2019 ජූලි 29 දිනැති අංක 2134/5, 2020 සැප්තැම්බර් 21 දිනැති අංක 2194/6, 2022 මාර්තු 27 දිනැති අංක 2272/53 හා 2022 දෙසැම්බර් 09 දිනැති අංක 2309/37 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනයන්හි ප්‍රකාශයට පත්කරන ලද නියමයන් මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2023 ජනවාරි 11 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

## උපලේඛනය I

| | 1 වන තීරුව | | 11 වන තීරුව |
|---|---|---|---|
| (i) | මත්තල මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළේ සිට ගුවන් යානයකින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන සෑම තැනැත්තෙක්ම | ජාත්‍යන්තර ගුවන් සමාගමක් විසින් මෙහෙයුම් ආරම්භ කරනු ලබන දින සිට වසර දෙකක් සඳහා | නිදහස් |
| (ii) | කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළ රත්මලාන සිට ගුවන් යානයකින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන සෑම තැනැත්තෙක්ම | 2022.03.27 සිට 2023.03.26 දක්වා | ඇ.ඩො. 30.00 |
| (iii) | යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළ සිට ගුවන් යානයකින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන සෑම තැනැත්තෙක්ම | 2023.01.12 සිට 2023.07.11 දක්වා | ඇ.ඩො. 30.00 |
| (iv) | ඉහත (i), (ii), හා (iii) හැර වෙනත් ඕනෑම ගුවන්තොටුපළක සිට ගුවන් යානයකින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන සෑම තැනැත්තෙක්ම | | ඇ.ඩො. 60.00 |
| (v) | නැවකින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන සෑම තැනැත්තෙක්ම | | ඇ.ඩො. 60.00 |

## උපලේඛනය II

2003 අංක 25 දරන මුදල් පනතේ 17 වැනි වගන්තිය යටතේ වන නියෝග.

1. මේ නියෝග 2023 අංක 1 දරන අපගමන බදු (ගුවන් සමාගමේ/නැවේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර, ඒවා 2023 ජනවාරි 12 වැනි දින සිට ක්‍රියාත්මක වනු ඇත.

2. පනතේ 2 වන වගන්තියේ (2) වන උපවගන්තිය ප්‍රකාරව අපගමන බද්ද ගෙවීමෙන් යම් මගියෙකු නිදහස් කරනු ලැබ ඇත්නම් මිස, ශ්‍රී ලංකාවෙන් බැහැරව යන ගුවන් යානයක් ක්‍රියාත්මක කරන ගුවන් සමාගමක/නැවක සෑම ක්‍රියාකරුවෙකු විසින්ම, ශ්‍රී ලංකාවෙන් එවැනි ගුවන්යානයකින්/නැවකින් පිටත්ව යන එක් එක් මගියෙකු සම්බන්ධයෙන්, මුදල් අමාත්‍යවරයා විසින් කලින් කල *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නියමයක් මඟින් තීරණය කරනු ලබන මුදලක් අපගමන බද්දක් වශයෙන් අයකර ගනු ලැබිය යුතුය.

3. (1) 2 වන නියෝගයෙහි සඳහන් යම් ගුවන් සමාගමක/නැවක සෑම ක්‍රියාකරුවෙකු විසින්ම, අපගමන බද්ද ගෙවීම සහ අයකර ගැනීමේ ක්‍රමය සහ ආකාරය සම්බන්ධයෙන්ද, එසේ අය කර ගත් මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යැවීමේ ආකාරය සම්බන්ධයෙන් ද, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කර ඇති විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතුය.

   (2) ගුවන් සමාගමක/නැවක සෑම ක්‍රියාකරුවෙකු විසින්ම, නිසි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙත එවැනි වාර වාර්තා හෝ ගුවන් යානය හෝ නැව, ගුවන් ගමන් කාලසටහන් හෝ නැව් ගමන් කාලසටහන්, සංක්‍රමණික මගීන් සහ වයස අවුරුදු දෙකකට අඩු ළමුන් ඇතුළු මගීන් සංඛ්‍යාව ලබා දිය යුතුය. අදාළ මගී ප්‍රකාශන, අපගමන බද්ද අයකර ගැනීම යනාදී අදාළ වෙනත් තොරතුරු නිසි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට කලින් කළ අවශ්‍ය විය හැකි පරිදි ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

4. (1) මගීන් සමඟ ශ්‍රී ලංකාවෙන් පිටත් වන ගුවන් යානයක් මෙහෙයවන ගුවන් සමාගමක හෝ නැවක සෑම මෙහෙයුමක්ම නිසි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරන ලද පරිදි, අපගමන බදු වශයෙන් අයකර ගත යුතු මුදල් සඳහා ඇප වශයෙන් නිසි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි මුදලක් නිසි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත තැන්පත් කර තැබිය යුතුය. නැතහොත් ඒ මුදල සඳහා නිසි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නමට ලියන ලද බැංකු ඇපකරයක් ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(2) 2 වන නියෝගය යටතේ අපගමන බද්ද ලෙස එකතු කළ සියලුම මුදල් සම්බන්ධයෙන් ලබා දිය යුතු තැන්පතු ප්‍රමාණය හෝ ලබාදිය යුතු බැංකු ඇපකරයේ වටිනාකම තීරණය කිරීමේ දී නිසි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පහත දැක්වෙන කරුණු සැලකිල්ලට ගත යුතුය.

(i) එම ගුවන් යානයේ උපරිම මගී ආසන සංඛ්‍යාව හෝ එම නැවේ මගී ධාරිතාව ;
(ii) සතියකට ගමන් කරන ගුවන් ගමන්/නැව් සංඛ්‍යාව ;
(iii) ක්‍රියාත්මක කිරීමේ ස්වභාවය සහ විෂය පථය ;
(iv) දින පහළොවක කාලයක් සඳහා ගුවන් සමාගම / නැව අපගමන බද්ද වශයෙන් එකතු කරන ඇස්තමේන්තුගත මුදල් ප්‍රමාණය.

(3) නිසි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරනු ලබන බැංකු ඇපකරයේ, කාල සීමාව අදාළ අවස්ථාවේ දී අවුරුද්දක කාල සීමාවකට වඩා වැඩි නොවිය යුතුය.

5. (1) අපගමන බද්ද වශයෙන් නිසි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලැබී ඇති මුදල්, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්-වරයා විසින් ඔහු වෙත ලිඛිතව දැනුම් දී ඇති නියෝජිත ආයතන අතර, බෙදා දෙනු ලබන බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සහතික විය යුතුය.

(2) පනතේ 5 වන වගන්තියේ (1) උප වගන්තියේ අවශ්‍යතාවලට යටත්ව ගුවන් යානා හෝ නැව් ක්‍රියාත්මක කිරීමෙන් නිසි බලධාරී අධ්‍යක්ෂ ජනරාල් විසින් අපගමන බද්ද වශයෙන් එකතු කරන ලද සියලුම මුදල් එසේ ලැබුණු දින සිට දින හතලිස් පහක් (45) ඇතුළත බෙදා දෙනු ලැබූ බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සහතික විය යුතුය.

6. නිසි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්

(අ) 5 වන වගන්තියේ (2) උපවගන්තියේ නියම කොට ඇති පරිදි 1 වන වගුවෙහි දක්වා ඇති ආකාරයට සාරානුකූල වූ මාසික වාර වාර්තාවක් සහ;

(ආ) 2 වන වගුවෙහි දක්වා ඇති ආකෘතිය අනුව වූ අපගමන බද්ද බෙදා හැරීම පිළිබඳව විස්තර ඇතුලත් මාසික වාර්තාවක් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

7. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ නියෝගවල -

"පනත" යන්නෙන් 2003 අංක 25 දරන මුදල් පනත අදහස් වේ.

"ගුවන් සමාගමක්" යන්නෙන් ශ්‍රී ලංකාවෙන් පිටතට ගුවන් මගීන් රැගෙන යන ගුවන් යානයක් හෝ ගුවන් යානා ක්‍රියාත්මක කරන ගුවන් සමාගමක් අදහස් වේ.

"නැව" යන්නෙන් ශ්‍රී ලංකාවෙන් පිටත්ව මගීන් රැගෙන යන නැවක් අදහස් වේ.

"නිසි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නට ශ්‍රී ලංකාවෙන් පිටවන පුද්ගලයින්ගෙන් අපගමන බද්ද අය කිරීමට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් වේ.

(අ) ගුවන් යානයකින් යන්නෙන් 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 11 වැනි වගන්තිය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂ ජනරාල් අදහස් වේ.

(ආ) නැවෙන් යන්නෙන් 2006 අංක 3 දරන වෙළඳ නැව් (පදවි නාමය වෙනස් කිරීමේ) පනත මගින් සංශෝධිත 1971 අංක 52 දරන වෙළඳ නැව් පනත යටතේ පත් කරන ලද වෙළඳ නැව් අධ්‍යක්ෂවරයා අදහස් වේ.

2003 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතුය.

"ගුවන් සමාගමක/නැවක ක්‍රියාකරු" සම්බන්ධයෙන් වන විට

(අ) ගුවන් යානයක් යන්නට 2010 අංක 14 සිවිල් ගුවන් සේවා පනතේ ඇති අර්ථයම ඇත ; සහ

(ආ) නැවක් යන්නට හිමිකරු, හිමිකරු වෙනුවෙන් ක්‍රියා කරන සහ 1972 අංක 10 දරන නැව් නියෝජිත බලපත්‍ර පනත යටතේ බලපත්‍රයක් සන්තකයේ තබාගෙන සිටින පුද්ගලයෙකු හෝ එම නෞකාවේ කපිතාන්වරයා අදහස් වේ.

*වගුව 1*

| *අපගමන බද්ද අයකර ගැනීම සිවිල් ගුවන් සේවා/ වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් භාණ්ඩාගාර නියොජ්‍ය ලේකම්වරයා වෙත ඉදිරිපත් කල යුතු මාසික වාර්තාව* | | | | | |
|---|---|---|---|---|---|
| *වර්ෂය* | | *මාසය* | | *කාල සීමාව* | |
| | *ගුවන් සමාගමේ/ නැවේ නම* | *මගීන් සංඛ්‍යාව* | *එකතු කළ මුදල රු.* | | *එකතුව* |
| | | | *අපගමන බද්ද* | *පොළිය (ඇත්නම්)* | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

*වගුව 2*

| *බෙදා හැරීමේ විස්තර (භා.නි.ලේ වෙත සිවිල් ගුවන් සේවා/ වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු වාර්තාව)* | | | | | | |
|---|---|---|---|---|---|---|
| *වර්ෂය* | | | *මාසය* | | *කාල සීමාව* | |
| *අංකය* | *සංවිධාන/අරමුදල* | *(%)* | *මුදල් (රු.)* | *චෙක්පත් අංකය* | *දිනය* | *ලදුපත් අංකය* |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

EOG 02 - 153

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.